Department of Education,Sabaragamuwa Province/ Weekly School



නිපුණතාව 1.0 - ගිණුම්කරණය හා එහි අවශ්‍යතාව විග්‍රහ කරයි.

නිපුණතා මට්ටම 1.1 - ආයතනයක් කෙරෙහි ඇල්මක් දක්වන පාර්ශ්වයන්ට තීරණ ගැනීම සඳහා ගිණුම්කරණ තොරතුරු වැදගත් වන ආකාරය විග්‍රහ කරයි.

## ගිණුම්කරණය යනු -

- උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට තීරණ ගැනීම සඳහා ගිණුම්කරණ ඒකකයට අදාළ ආර්ථික තොරතුරු සැපයීමේ සමස්ත ක්‍රියාවලිය,ගිණුම්කරණයයි.

## ගිණුම්කරණයේ අරමුණ -

- ගිණුම්කරණ ඒකකය පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශවයන්ට තීරණ ගැනීම සඳහා අවශ්‍ය වන්නා වූ ආර්ථික තොරතුරු සන්නිවේදනය කිරීම ගිණුම්කරණයේ ප්‍රධාන අරමුණ වේ.
- ගිණුම්කරණ ඒකකය,පුද්ගලයෙක්,රජයක්,ව්‍යාපාර සංවිධානයක් ව්‍යාපාරයක් හෝ වෙනත් ඕනෑම කටයුත්තක් විය හැකිය.
- මෙහිදී ආර්ථික තොරතුරු ලෙස හඳුනා ගන්නේ මූල්‍යමය තොරතුරුය.

## අභ්‍යාස

1.ව්‍යාපාරයක මූල්‍යමය තොරතුරු හා මූල්‍යමය නොවන තොරතුරුවලට උදාහරණ 3 බැගින් දෙන්න.

2.ආයතනයකට ඇල්මක් දක්වන පාර්ශවයන් 5ක් නම් කර එසේ ඇල්මක් දැක්වීමට හේතු ලියන්න.